**Alcohol and Drug Information Centre**

ADIC

*No.40/18, Park Road, Colombo 5, Sri Lanka.*
*Tel: +94 11 2584416, +94 11 2592515, Fax: +94 11 2508484*
*E-mail: info@adicsrilanka.org, adicc@sltnet.lk*
*Web Site: http://www.adicsrilanka.org*

# මද්‍යසාර සමාගම්වල ඕනෑ එපාකම් සිදුකිරීම සුරාබදු දෙපාර්තුමේන්තුවේ කාර්යය භාරය ද ?

සුරාබදු, රජයක ආදායමක් ලෙස සැලකීම යල්පැන ගිය ආර්ථික ක්‍රමවේදයක් වන අතර සුරාබදුවලින් ලැබෙන මුදල් ප්‍රමාණය ගණනය කිරීමෙන් පමණක් රජයක ආදායමක් ලෙස සැළකීමට නොහැකිය. පුද්ගලයන්ගේ මද්‍යසාර භාවිතය නිසා ඔවුන්ගේ සෞඛ්‍ය, ආර්ථික හා වෙනත් වියදම් සඳහා රජයට දැරීමට සිදු වෙන මුදල හා සුරාබදු ප්‍රමාණය අතර ඇති පරතරය ගණනය කිරීමෙන් සුරාබදු මුදල රජයට ආදායමක් ද යන්න විද්‍යාත්මක ව තීරණය කළ යුතුය. මේ පිළිබඳ ශ්‍රී ලංකාවේ ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO), මද්‍යසාර හා දුම්කොළ ජාතික අධිකාරිය (NATA) හා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සිදු කළ අධ්‍යයනයක පැහැදිලි වන්නේ සුරාබදුවලින් 2015 වසරේ ලැබුණු මුදල රු මිලියන 105,234.00 වන විට එම වසරේ මද්‍යසාර භාවිතය නිසා රජයට දැරීමට සිදු වූ සෞඛ්‍ය සහ ආර්ථික පාඩුව රු මිලියන 119,660.00 වේ. මේ මගින් පැහැදිලි වන්නේ සුරාබදුවලින් ලැබෙන මුදල පමණක් සිතීම ඉතා පටු ආර්ථික සංවර්ධන දැක්මක් වන අතර මද්‍යසාර භාවිතය නිසා සිදු වෙන අලාබය ගණනය කිරීම ආර්ථික සංවර්ධනයේ වඩා ඵලදායි දැක්මක් වන බවය. දැනට දියුණු රටවල මෙම ක්‍රමය භාවිත කරන අතර නිවැරදි බදු ක්‍රම හඳුන්වා දෙමින් ක්‍රම ක්‍රමයෙන් රටේ මද්‍යසාර භාවිතය අඩු කිරීම ඔවුන් අනුගමනය කරන ක්‍රමයයි.

මද්‍යසාර භාවිතය නිසා ලෝකයේ සෑම තප්පර 10ටම වරක් පුද්ගලයෙක් අකාලයේ මරණයට පත් කරයි. රටක මිනිසුන් පරිභෝජනය කරන මද්‍යසාර ප්‍රමාණය පහළ යෑම එම රටේ මරණ හා රෝගාබාධ ඇති කිරීම පහළ යෑමට බලපාන ප්‍රධාන සාධකයක් බව හඳුනාගෙන ඇත. දැනට මද්‍යසාර භාවිතා කරන පිරිස් භාවිතා කරන මද්‍යසාර ප්‍රමාණය අඩු කිරීමටත්, අලුතෙන් පිරිස් මද්‍යසාර භාවිතය සඳහා යොමු වීම අවම කිරීමටත් ඇති ඉතා ප්‍රතිඵලදායක ක්‍රමෝපයක් ලෙස සුරා බදු වැඩි කිරීම ලෝක සෞඛ්‍ය සංවිධානය ඇතුළු මේ සම්බන්ධයෙන් පර්යේෂණ කරන ආයතන විසින් විද්‍යාත්මකව තහවුරු කර ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් මද්‍යසාර පාලනය සඳහා රටවල්වලට නිර්දේශ කර ඇති යෝජනා අතර මද්‍යසාරවල බදු සහ මිල ඉහළ දැමීම ප්‍රධාන ප්‍රතිඵලදායකම මැදිහත් වීමක් බව විද්‍යාත්මකව සනාථ කර ඇත.

2022 වසරේ දී මද්‍යසාර සාමාගම් විසින් නිෂ්පාදන වියදම ඉහළ ගිය බව පවසමින් අවස්ථා දෙකකදී ම මද්‍යාසාරවල මිල ඉහළ දමන ලදී. එම මිල ඉහළ දැමීම මත රජය බදු පැනවීමක් සිදු නොකළ අතර එමගින් රජයට අයකර ගත යුතුව තිබූ අතිවිශාල බදු මුදලක් රජයට අහිමි විය.

පසුගිය අයවැය යෝජනා මගින් මද්‍යසාර සඳහා වූ සුරා බදු 20% වැඩි කිරීමට රජය විසින් තීරණය කෙරිණි. මෙම බදු පැනවීම මගින් රජයේ බලාපොරොත්තුව වූ රජයේ ආදායම ඉහළ දැමීමත්, මත්පැන් භාවිතය අධෛර්යමත් කිරීමත් යන කාරණා දෙකම ඉෂ්ඨ කරගනිමින් සිටින බව පෙනී යයි.

මෙවන් වාතාවරණයක් යටතේ සුරාබදු දෙපාර්තමේන්තුව, මද්‍යසාර සමාගම්වල අලෙවිය පහළ ගොස් ඇති බව පවසමින් සුරා බදු අඩු කරන ලෙස යෝජනා කර ඇති බව ජනමාධ්‍ය තුළින් දැකීම විමතියකට කරුණකි. මේ ආකාරයට සුරාබදු දෙපාර්තුමේන්තුව දක්වන හේතු ලෙස සඳහන් කර ඇත්තේ මද්‍යසාර සමාගම්වලට සිදු වී ඇති පාඩුව සහ අනවසර මද්‍යසාර පරිභෝජනය ඉහළ යන බව පැවසීමයි.

සුරාබදු දෙපාර්තුමේන්තුවේ උත්සාහය වී ඇත්තේ,

1. මද්‍යසාර සමාගම්වල ලාභය වැඩිකිරීම
2. නීත්‍යානුකූල නොවන මද්‍යසාර කර්මාන්තය පාලනය කිරීම සඳහා නීත්‍යානුකූල මද්‍යසාරවල මිල පහළ දැමීම

ඉහත කාරණා දෙකම සුරා බදු දෙපාර්තුමේන්තුවේ කාර්යය භාරය නොවන අතර ඔවුන් කළ යුතුව තිබෙන්නේ සුරා බදු ආදායම ඉහළ දැමීමට කටයුතු කිරීම සහ නිත්‍යානුකූල නොවන මද්‍යසාර පාලනය සඳහා පොලීසිය සමග එකාබද්දව කටයුතු කර නීත්‍යානුකූල නොවන මද්‍යසාර කර්මාන්තය පාලනය කිරීමයි.

තවද සුරාබදු ආදායම රටේ දැවැන්තම බදු ආදායම ලෙස හුවා දැක්වීමට උත්සාහ කළ ද මහ බැංකුවේ වාර්තාවන්ට අනුව බදු ආදායමෙන් මද්‍යසාර සුරාබදුවලින් සැපයෙන්නේ 11% වැනි කුඩා ප්‍රමාණයකි. එයද ආදායමක් ලෙස සැලකීමට නොහැකි ය. ඉහතින් අප සඳහන් කළ අධ්‍යනයකට අනුව ශ්‍රී ලංකාවේ මද්‍යසාර ආදායම සහ වියදම පිළිබඳ සිදු කළ  පර්යේෂණයකදී පැහැදිලි වන්නේ සුරාබදුවලින් දිනකට රුපියල් මිලියන 288.31 උපයන විට, 2015 දී  මද්‍යසාර භාවිතය නිසා දිනකට සිදුවූ ආර්ථික හානිය රුපියල් මිලියන 327.86 ලෙසය.

මද්‍යසාර පාලනය වෙනුවෙන් ක්‍රියාමාර්ග ගැනීම රටකට සෑම විටකම වාසි සහගත වන අතර එය මද්‍යසාර සමාගම් වලට අවාසි සහගත තත්වයකි. රජයේ නිලධාරීන්ගේ ක්‍රියා කලාපය විය යුත්තේ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මිස මද්‍යසාර සමාගම්වල ඕනෑකම් ඉටුකිරීම නොවන බව මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය තරයේ අවධාරණය කර සිටිමු.

**මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය**

**2023.03.16**